නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

මූලික කාරණා අන්තර්ගත ලේඛනය

- විද්‍යුත් ප්‍රකාශන

ප්‍රධාන කාරණා අන්තර්ගත ලේඛනය - විද්‍යුත් ප්‍රකාශන

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සහ මූලික අවදානම්	ප්‍රධාන නියම හා කොන්දේසි
විද්‍යුත් ප්‍රකාශන සේවය	• මුරවචන ආරක්ෂාව සමගින් සහතික කරන ලද ආරක්ෂාව. • NDB බැංකුවේ ඔබගේ සියලු නිෂ්පාදන සේවා අධීක්ෂණයක් පිළිඹිබු කරනු ලබන ඒකාබද්ධ විද්‍යුත් ප්‍රකාශයක් ලබා ගැනීම.	අයකිරීම් අදාල නොවේ.	• වර්තමාන ගිණුම් හිමියන් විසින් ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීම මගින් හෝ සමීපතම බැංකු ශාඛාව වෙත පැමිණීම මගින් විද්‍යුත් ප්‍රකාශන	1. ස්වකීය නම්කල (designated) විද්‍යුත් ලිපිනයේ ආරක්ෂාව සහතික කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන් වගකියනු ලැබිය යුතුවේ. 2. පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානය අමතා දැනුම්දීම මගින් ස්වකීය නම්කල විද්‍යුත් ලිපිනය වෙනස් කරනු ලැබිය හැකිවේ. 3. විද්‍යුත් ප්‍රකාශ නිවැරදි ග්‍රාහකයා වෙත ලැබීම සඳහා නිවැරදි විද්‍යුත් ලිපිනය බැංකුවේ යාවත්කාලීන කර තැබිය යුතුවේ. 4. විද්‍යුත් ප්‍රකාශ බලාගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට ඇඩෝබ් ඇක්‍රොබේට් අනුවාද 6 හෝ යම් අනාගත යෙදුමක් භාවිත කිරීම අවශ්‍ය වේ. 5. ගනුදෙනුකරුවන් විසින් විද්‍යුත් ප්‍රකාශ සම්බන්ධයෙන් නම්කරන ලද ස්වකීය විද්‍යුත් ලිපිනය නිරන්තරයෙන් පරීක්ෂා කිරීම සිදුකල යුතුවේ. 6. විද්‍යුත් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබිය නොහැකි විට, ගනුදෙනුකරුගේ ඉල්ලීම පරිදි කඩදාසි පත්‍රිකා ප්‍රකාශනයක් නිකුත් කල හැක. 7. ප්‍රකාශන නිකුත් කිරීම එක් එක් මාසයේ අවසාන දිනයේදී නිකුත්කරන පරිදි මාසිකව සිදුකරනු ලැබේ.

	• මාසික ඉතුරුම් සහ වියදම් පිළිබඳ ප්‍රස්ථාරගත විස්තරයක්. • විද්‍යුත් ප්‍රකාශය පහසුවෙන් අවබෝධකරගත හැකිවීම. • ඔබගේ මූල්‍ය විශ්ලේෂණය ඔබටම සිදුකරගැනීමේ හැකියාව • ගනුදෙනුවෙන් ගනුදෙනුවට විස්තර පෙන්නුම්කරනු ලබන තනි පුද්ගල ගිණුම්වල විද්‍යුත් ප්‍රකාශ		සේවාව ලබා ගැනීම සඳහා ලියාපදිංචි විය හැකිය. • බැංකුව සමග ඔබගේ ගිණුම් විවෘත කරනු ලබන අවස්ථාවේදී ඔබ විසින්මද මෙම සේවාවට ඇතුලත්විය හැකි වේ.	8. ගනුදෙනුකරුවන් විසින් කඩිනමින් ස්වකීය විද්‍යුත් ප්‍රකාශ දර්ශනය කරගත යුතුවේ. යම් වැරදි, අක්‍රමිකතා හෝ අනවසර ගනුදෙනු පිළිබඳව +94112448888 දරන අංකය ඔස්සේ වහාම බැංකු ඇමතුම් මධ්‍යස්ථානය වෙත දැනුම් දෙනු ලැබිය යුතුවේ. 9. බැංකුව කිසිදු අවස්ථාවක දී විද්‍යුත් ලිපිනය හරහා ගිණුම් හෝ ආරක්ෂණ විස්තර ඉල්ලා නොසිටිනු ඇත. 10. විද්‍යුත් ප්‍රකාශන සම්ප්‍රේෂණය කිරීම පිළිබඳ ආරක්ෂාව සම්බන්ධයෙන් බැංකුව හැකි සෑම උත්සාහයක්ම ගනු ලබන අතර සන්නිවේදන හෝ ජාල අක්‍රිය වීමක් හේතුවෙන් විද්‍යුත් ප්‍රකාශවල සිදුවන බිඳවැටීම් හෝ ප්‍රමාදයන් සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ. 11. බැංකුව විසින් විද්‍යුත් ප්‍රකාශ හරහා කාලීනව ස්වකීය නිෂ්පාදන සහ සේවාවන් ප්‍රචාරය කරනු ලැබිය හැකිය. 12. බැංකුවේ වෙබ් අඩවියෙහි පූර්ව දැන්වීමක් ලබාදීම මගින් බැංකුවේ පරම අභිමතය යටතේ කලින් කලට රීති හා නියෝග මෙන්ම නියම හා කොන්දේසි වෙනස් කිරීමේ/ ප්‍රතිශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතුවේ. සේවාව භාවිත කිරීම මගින් ගනුදෙනුකරු මේ නියම සහ කොන්දේසිවලට එකඟවන බවට සහ ඒ නියම සහ කොන්දේසි ගනුදෙනුකරුට ලැබුණු බවට මෙන්ම විද්‍යුත් තැපෑල හරහා විද්‍යුත් ප්‍රකාශන සම්ප්‍රේෂණය කිරීමේ දී පවතින අවදානම් ගනුදෙනුකරු විසින් පිළිගන්නා බවට සළකනු ලැබේ. 13. වැඩිදුර විස්තර සඳහා කරුණාකර NDB බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ බාගතකිරීමේ අංශයේ විද්‍යුත් ප්‍රකාශන යටතේ පවතින නියම හා කොන්දේසි කියවා බලන්න.

ඔබගේ පසුවිපරම අප සමග හුවමාරු කරගන්න

සියලු අවස්ථාවලදී ඔබ සෑහීමට පත්වන ආකාරයට ඔබවෙත අපගේ සේවා සැපයීම සඳහා අප ඇපකැපවී සිටින්නෙමු.

අප විසින් ඔබගේ අපේක්ෂාවන් කොතරම් හොඳින් ඉටුකර ඇද්ද යන්න පිළිබඳව දැනගැනීම සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී දියුණු කරගතයුතු කරුණු පිළිබඳව දැනුවත්වීම සඳහා ඔබගේ පසුවිපරම අප හට උපකාරීවනු ඇත.

ඔබගේ පසුවිපරම හුවමාරු කරගත යුතු ආකාරය:

ඔබට ඔබගේ ශාඛා කළමනාකරු හෝ ඔබගේ සම්බන්ධතා කළමනාකරු හා සම්බන්ධ විය හැකි ය.

අංක. +94(1) 11 2448888 දරන පැය 24 පුරා ක්‍රියාත්මකවන ඇමතුම් මධ්‍යස්ථාන අංකය අමතන්න.

අප වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න:- contact@ndbbank.com

ලිඛිතව ඉදිරිපත් කරන්න:- කළමනාකරු, ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකාර අංශය, නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී අංක. 40 නවම් මාවත, කොළඹ 02

අප විසින් ප්‍රතිචාර දක්වන ආකාරය;

පැමිණිල්ල ලැබීමෙන් පසුව, අප විසින් එය බැංකුවේ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ පද්ධතියෙහි වාර්තාකර එම ගැටලුව වහාම විසඳීම සඳහා උත්සාහ කරන්නෙමු. අපට එසේ ක්‍රියාකිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අප විසින් ඔබ වෙත වැඩකරන දින තුනක් ඇතුලත විසඳුමක් ලබා දෙන්නෙමු. පැමිණිල්ලේ ස්වභාවය අනුව මෙම කාලසීමාව තුලදී මෙම ගැටලුව විසඳීමට අපට නොහැකි වුවහොත්, අප විසින් ඔබවෙත ප්‍රතිචාර දක්වනු ලබන ඇස්තමේන්තුගත කාලය පිළිබඳව ඔබව දැනුවත් කරන්නෙමු.

ඔබගේ ගැටළුවට අපෙන් ලැබුණු පිළිතුර පිළිබඳව ඔබ කිසිසේත් සෑහීමට පත් නොවන්නේ නම්, ඔබට ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය හෝ ශ්‍රී ලංකා මහා බැංකුවේ මූල්‍ය පාරිභෝගික සම්බන්ධතා අංශය (FCRD) අමතා සම්බන්ධ විය හැකිය.

ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය (Office of The Financial Ombudsman - SL)
සන්දියානි විජේසිංහ මිය
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය, නො. 01, බෙතෙස්දා පෙදෙස , මිලාගිරිය, කොළඹ 05.
කාර්යාල දුරකථන අංකය: +94 11 259 5624 ටෙලි/ෆැක්ස්: +94 11 259 5625
විද්‍යුත් තැපෑල: fosril@sltnet.lk වෙබ් අඩවිය: www.financialombudsman.lk

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව (CBSL - FCRD)
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ - 01.
විමසීම් සඳහා ක්ෂණික ඇමතුම් (Hotline): 1935
දුරකථන: +94 112 477 966 ෆැක්ස්: +94 112 477 744
විද්‍යුත් තැපෑල: fcrd@cbsl.lk